

# කතෝලික ධර්මය

## 9 ශ්‍රේණිය





Copyright © www.e-thaksalawa.moe.gov.lk



# 22 පාඩම - යහපත් දේ අයදිමු




1) ප්‍රසාද ස්නාපනය මගින් කිතුණුවාට හිමිවන ජීවිත දෙක ලියා දක්වන්න

2) ශු. මතෙව් සුභාරංචියට අනුව යහපත් දේ අයදීම පිළිබඳව සඳහන් වන්නේ කුමක්ද ?

3) සලමොන් රජු හට දෙවියන් වහන්සේ දර්ශනය වූ ස්ථානය නම් කරන්න

4) එහිදි සලමොන් රජතුමා දෙවියන් වහන්සේගෙන් කළ ඉල්ලීම කුමක්ද?

5) සලමොන් රජතුමාගේ ඉල්ලීමෙන් අපට ගත හැකි ආදර්ශය කුමක්ද?

6) ප්‍රඥාව යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

පී . ඩී පිලීෂියා අයිරින් කතෝලික ධර්මය ගුරුඋපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය කැළණිය
සැකසුම : ජී.කේ සත්‍ය ධනංජය ජයරත්න, හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය - වීරකැටිය
Copyright © www.e-thaksalawa.moe.gov.lk



7) අපි එදිනෙදා ජීවිතයේදි ප්‍රඥාවෙන් කටයුතු කළ යුතු අවස්ථා 5ක් ලියන්න

____________________________________________________

____________________________________________________

____________________________________________________

____________________________________________________

____________________________________________________

8) ලෞකිකත්වයෙන් ඈත්වි ජේසුස් වහන්සේ තුළින්ම සදාතනික ජීවිතය කරා ළං වීමට අප කුමක් කළ යුතුදැයි කරුණු 3කින් පැහැදිලි කරන්න

____________________________________________________

____________________________________________________

____________________________________________________

7) අප කරන යහපත් දේ පිළිබඳ තීරණය කරන්නේ කවුරුන් විසින් ද?

____________________________________________________

8) කොවිඩ් 19 වසංගතයට නතු වී පීඩා විඳින සැමදෙන වෙනුවෙන් මෙම යාච්ඤාව උච්චාරණය කරන්න



අති පරිශුද්ධ ලෝක රාජේශ්වරියනී,
මනුෂ්‍යය ජාතින්ගේ බලවන්ත මධ්‍යස්ථිකාවෙනි
මුළු මහත් ලෝකයම භයංකාර වසංගතයකින් වසාගෙන
සමස්ත මිනිස් සමාජයම අකර්මන්‍යව අඳුරු ආගාධයක ගිලෙමින් තිබෙන
මේ තීරණාත්මක මොහොතේදී ඔබ නිර්මල පාද පද්මය ළඟ දනින් වැටී
අප කරන මේ හෘදයාංගම කන්නලව්වට සවන් දීමට කරුණා කළ මැනව.
බිහිසුනු ව්‍යසන, විපත්ති, වසංගත, යුද්ධ සංග්‍රාම වලදී
අසරණ අපේ එකම සරණය වූ සෙනෙහෙවන්ත මෑණියනී,
අප මාතෘ භූමියට කිසිසේත්ම දැරිය නොහැකි මේ විනාශකාරී වසංගතය
ව්‍යාප්ත වීම වැළැක්වීමට කඩිනමින් මැදහත් වුව මැනව.
මිනිස් බුද්ධියෙන් හා පරිශ්‍රමයෙන් කළ හැකි හැමදේම කළ පසුත්
තවමත් මර්ධනය කරගැනීමට නොහැකි වූ මෙම රුදුරු
කොරෝනා රකුසාගෙන් අප රට වැසි සියලු දෙනා ද
මුළු ලෝක ජනතාව ද රැකගත මැනව.
දෙවන ලෝක යුද්ධ සමයේදී සතුරු හමුදාවන්ගේ
මරුකටින් අප බේරාගත් ලංකා අප ස්වාමිදුවෙනි,
මෙ භයානක වසංගත පීඩාවෙන් අප ආදරණීය මව්බිම ද
මුළු මහත් ලෝකයද බේරා දුන මැනව.
අනේ අති කරුණාබර කුමරි මෑණියනි,
මනුෂ්‍යයන්ගේ මුරණ්ඩුකමත් මුල මතක නැතිකමත් නිසා
අකීකරුකමින් සහ අධර්මිෂ්ඨකමින් ගෙවන ඔවුන්ගේ ආත්මාර්ථකාමී
පව්කාර පැවැත්මේ ප්‍රතිවිපාක ඔවුන්ට පෙන්වා දුන මැනව.
සියලු මනුෂ්‍යන් තුළ සැබෑ පසුතැවිල්ලක් හා
ප්‍රතිහාර්යාත්මක සිත් හැරීමක් ඇතිවීමට සැලැසුවුව මැනව.
දේව නීතියත් විශ්ව නීතියත් ප්‍රතික්ෂේප කරමින් දෙවියන් වහන්සේ
අපට දුන් මේ මනහර මැවිල්ලට මහත් සේ හානි පමුණුවමින්
මනුෂ්‍යයා පතන ප්‍රගතියේ අවසාන ප්‍රතිඵලය හිස් මායාවක් බව ඔවුනට
ප්‍රත්‍යක්ෂ කළ මැනව.
දේව කැමැත්තට හිස නැමීමේ දී කොන්දේසි වරහිතව එසේ කරමින්
ඉහළම ආදර්ශය අපට දුන් නිර්මල දේව මාතාවෙනි,
හෘද සාක්ෂියේ ශුද්ධ වූ හඬ ශබ්දයට සවන් දී දේව අභිමතයට යටහත් වී
සහෝදරත්වයේ සහ සහජීවනයේ සදාචාරසම්පන්න
සමාජයක් බිහි කිරීමට ඔබගේ මාතෘක මැදහත්කම තුළ
දෙව් පියාණන් වහන්සේගේ බහුල ආශිර්වාදය නිරතුරුව
අප සැමට ලබා දුන මැනව.
ආමෙන්.



Copyright © www.e-thaksalawa.moe.gov.lk